උපලේඛනය

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | |
| *(1)* | *(2)* | | *(3)* | *(4)* | *(5)* | *(6)* |
| 71.08 | | | **සකස් නොකළ හෝ අඩ වශයෙන් නිෂ්පාදිත ස්වරූපවලින් යුත්, හෝ කුඩු ආකාරයෙන් වූ, රත්රන් (ප්ලැටිනම් සමග ආලේපිත, රත්රන් ඇතුළුව),** | | | |
| | | - | මූල්‍ය නොවන : | | | |
| | 7108.11 | -- | කුඩු | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 15% | කි.ග්‍රෑ. |
| | 7108.12 | -- | අනෙකුත් සකස් නොකළ | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 15% | කි.ග්‍රෑ. |
| | 7108.13 | -- | අනෙකුත් අර්ධ වශයෙන් නිෂ්පාදිත ස්වරූප වලින් යුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 15% | කි.ග්‍රෑ. |
| | 7108.20 | - | මුදල් හා සම්බන්ධ වූ (මූල්‍යමය) | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4% | 15% | කි.ග්‍රෑ. |

08 - 683

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.